# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2483/15 - 2026 අප්‍රේල් මස 10 වැනි සිකුරාදා - 2026.04.10**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 වන අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1) (අ) වගන්තිය යටතේ**

**මාතලේ මහ නගර සභාවේ**

**සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

ඉල්ලා අස්වීම හේතුකොටගෙන මාතලේ මහ නගර සභාවේ සභික ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66අ(1) (අ) වගන්තිය යටතේ මාතලේ මහ නගර සභාවේ, අංක 6 - දුම්රියපොල පෙදෙස කොට්ඨාසයට තේරී පත් වූ මුහමඩ් මන්සූර් මුහමඩ් නව්සාඩ් මහතා අයත් වන්නා වූ ජාතික ජන බලවේගය නම් පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහක (30) කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතුයැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම මාතලේ මහ නගර සභාවේ අංක 6 - දුම්රියපොල පෙදෙස කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ක්‍රිෂාන් තුෂාර දර්ශික වාසලගේ මහතා නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද;

මාතලේ මහ නගර සභාවේ තේරීම්භාර නිලධාරි හෙට්ටිගේ ආසිරි එරංග පුෂ්පකුමාර වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය) 66අ(1) (අ) වගන්තිය ප්‍රකාරව, ක්‍රියා කරමින් ක්‍රිෂාන් තුෂාර දර්ශික වාසලගේ මහතා, මාතලේ මහ නගර සභාවේ, අංක 6 - දුම්රියපොල පෙදෙස කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරා පත්කර ගත්බව මෙයින් ප්‍රකාශ කරමි.

**එච්. ඒ. ඊ. පුෂ්පකුමාර,**
තේරීම්භාර නිලධාරි,
මාතලේ මහ නගර සභාව.

2026 අප්‍රේල් මස 10 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
මාතලේ.

EOG 04 - 0056

1A - PG 7596 — 08 (2026/04)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**(262 වන අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1) (අ) වගන්තිය යටතේ**
**මීරිගම ප්‍රාදේශීය සභාවේ**
**සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

ඉල්ලා අස්වීම හේතුකොටගෙන මීරිගම ප්‍රාදේශීය සභාවේ සභික ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66අ(1) (අ) වගන්තිය යටතේ මීරිගම ප්‍රාදේශීය සභාවේ, අංක 25 - පස්යාල කොට්ඨාසයට තේරී පත් වූ වීරප්පුලිගේ තිලිනි ඉමල්කා ඩයස් මහත්මිය/මෙනවිය අයත් වන්නා වූ ජාතික ජන බලවේගය නම් පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහක (30) කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතුයැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම මීරිගම ප්‍රාදේශීය සභාවේ, අංක 25 - පස්යාල කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා මහ පතිරුන්නැහැලාගේ ශිරාණි දේවිකා නිල්මිණි මහත්මිය/මෙනවිය නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද;

මීරිගම ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි විතාන අප්පුහාමිල්ලාගේ රවීන්ද්‍ර වික්‍රමසිංහ වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය) 66අ(1) (අ) වගන්තිය ප්‍රකාරව, ක්‍රියා කරමින් මහ පතිරුන්නැහැලාගේ ශිරාණි දේවිකා නිල්මිණි මහත්මිය/මෙනවිය, මීරිගම ප්‍රාදේශීය සභාවේ, අංක 25 - පස්යාල කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරා පත්කර ගත්බව මෙයින් ප්‍රකාශ කරමි.

**ඩබ්ලිව්. ඒ. රවීන්ද්‍ර වික්‍රමසිංහ,**
තේරීම්භාර නිලධාරි,
මීරිගම ප්‍රාදේශීය සභාව.

2026 අප්‍රේල් මස 08 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
ගම්පහ දිස්ත්‍රික්කය.

EOG 04 - 0057

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.